

හදිසි අවස්ථාවකදී

## ශ්‍රී ලාංකීය පූර්ව රෝහල් ප්‍රතිකාර සේවාවේ
# සාඩම්බර නියෝජිතයකු වන්න!




"1990 සුව සැරිය ගිලන් රථ සේවාව" යනු ශ්‍රී ලංකාවේ පුරෝගාමී හදිසි සත්කාර සහ පූර්ව රෝහල් ගිලන් රථ සේවය වන අතර, එය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. "1990 සුව සැරිය ගිලන් රථ සේවාව" ජීවිත බේරාගැනීමේ මෙහෙවරක යෙදෙන අතර, ගිලන් රථ 322ක් සමඟින් දිවයින පුරා ක්‍රියාත්මක වේ.

දිවයින පුරා ජීවිත බේරා ගැනීම සඳහා කැපවූ හදිසි සහ පූර්ව රෝහල් සත්කාර ගිලන්රථ සේවාවක් සපයන මෙම පදනම සඳහා හදිසි වෛද්‍ය තාක්ෂණ නිලධාරී (EMT) තනතුර, හදිසි ප්‍රතිචාර නිලධාරී (EMD) තනතුර සහ ගිලන් රථ රියදුරු (Pilot) තනතුර සඳහා සුදුසු, සුදුසුකම් ලත් සහ ක්‍රියාශීලී පුද්ගලයින්ගෙන් කළමනාකරණ මණ්ඩලය අයදුම්පත් කැඳවනු ලැබේ.

## හදිසි වෛද්‍ය තාක්ෂණ නිලධාරී (EMT) - පුරුෂ / ස්ත්‍රී

### සුදුසුකම්

- වයස අවුරුදු 35ට නොවැඩි වීම
- අ.පො.ස. උසස් පෙළ (A/L) ඕනෑම විෂය ධාරාවකින් විෂයන් 3 කින් සමත් වීම (ජීව විද්‍යා ක්ෂේත්‍රයක ධාරාවට ප්‍රමුඛත්වය හිමිවේ) හෝ සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ පාඨමාලාවකින් NVQ 4 මට්ටම ලබා තිබීම.
- අ.පො.ස. සාමාන්‍ය පෙළ (O/L) ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබීම
- මූලික තොරතුරු තාක්ෂණ (IT) දැනුම සහ අමතර භාෂා දක්ෂතා තිබේ නම් අමතර සුදුකමක් වේ
- හදිසි වෛද්‍ය සේවා (EMS) පිළිබඳ පෙර පළපුරුද්ද තිබේ නම් අමතර සුදුකමක් වේ
- අවම උස:
  - පුරුෂ - අඩි 5 අඟල් 4
  - ස්ත්‍රී - අඩි 5 අඟල් 2
- ශරීර දර්ශකය (BMI): 18.5 - 27 අතර විය යුතුය
- දෘෂ්‍ය තීව්‍රතාවය: 20/20 සහ 20/30 අතර විය යුතුය

සැ.යු: සියලුම අයදුම්කරුවන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයක් සාර්ථකව සමත් විය යුතුය. තේරී පත්වන අයදුම්කරුවන් 1990 සුව සැරිය පදනම විසින් විශ්වවිද්‍යාලයක සහයෝගයෙන් පවත්වන ඩිප්ලෝමා පාඨමාලාවක් අනිවාර්යයෙන් අනුගමනය කළ යුතුය. පාඨමාලාව සාර්ථකව අවසන් කරන අයදුම්කරුවන්, අවම වශයෙන් වසර 03ක් මෙම ආයතනයට සේවය කිරීම අනිවාර්ය වේ. තවද, විදේශීය අත්දැකීම් ලබාගැනීම සඳහා අවස්ථාද සපයනු ලැබේ.

## ගිලන් රථ රියදුරු (Pilot)

### සුදුසුකම්

- වයස අවුරුදු 35ට නොවැඩි වීම
- අ.පො.ස. සාමාන්‍ය පෙළ (O/L) අවම විෂයයන් 06කින් සමත් වීම
- පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර දෙක (02) ක සේවා පළපුරුද්දක් සහිත බර වාහන ධාවන බලපත්‍රයක් (Heavy Vehicle Driving License) තිබිය යුතුය
- සිංහල හෝ දෙමළ භාෂාවල නිපුණත්වය
- ඉංග්‍රීසි භාෂා දක්ෂතාවය අමතර සුදුකමක් වේ
- අවම උස: අඩි 5 අඟල් 2
- ශරීර දර්ශකය (BMI): 18.5 - 27 අතර විය යුතුය
- දෘෂ්‍ය තීව්‍රතාවය: 20/20 සහ 20/30 අතර විය යුතුය

සැ.යු: සියළු අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණය (Aptitude Test) සමත් විය යුතුයි.

## හදිසි ප්‍රතිචාර නිලධාරී (Emergency Medical Dispatcher - EMD)

### සුදුසුකම්

- වයස අවුරුදු 35ට නොවැඩි වීම
- අ.පො.ස. උසස් පෙළ (A/L) ඕනෑම ධාරාවකින් විෂය 03කින් සමත් වීම
  - සිංහල සහ දෙමළ භාෂාවල නිපුණත්වය
  - ඉංග්‍රීසි භාෂා නිපුණත්වය සහ තොරතුරු තාක්ෂණ (IT) දැනුම අමතර සුදුකමක් වේ

සැ.යු: සියළු අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණය(Aptitude Test) සමත් විය යුතුයි.

උනන්දුවක් ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් **careers@1990.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කළ හැකි අතර, නැතිනම් **1990 සුව සැරිය පදනම, අංක 43, හෝර්ටන් පෙදෙස, කොළඹ - 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් යොමු කළ හැක. විද්‍යුත් තැපෑලෙන් අයදුම්පත් යොමු කරන විට, **විද්‍යුත් තැපැලේ විෂය රේඛාවේ (Subject Line)** අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. තැපෑල මගින් යොමු කරන අයදුම්පත් වලදී, **ලිපි කවරයේ ඉහළ මධ්‍යභාගයේ** අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. සියලුම අයදුම්පත් **2026.02.22** දිනට හෝ එයට පෙර ලැබෙන ලෙස යොමු කළ යුතුය.

**මානව සම්පත් සහ පරිපාලන අංශ ප්‍රධානී., 1990 සුවසැරිය පදනම, නො.43, හෝර්ටන් පෙදෙස, කොළඹ - 07**